

තරු පලස ළමා සමාජය
අඹේපුස්ස

# ළ - තරු

තෛයිමාසික අන්තර්ජාල ළමා සඟරාව

**නිමක් ඉමක් නැති අහසේ පායන තරු**

2022 ඔක්තෝබර් - දෙසැම්බර් මංගල කලාපය

## මොන තනතුර දැරුවත් රටට සේවය කරන්න
පිටුව - 04

## සිරිපතුල අභිමි වූ අඹේපුස්ස
පිටුව - 07

## මම හරිම කැමතියි මට අත්පුඩි ගහනවට
පිටුව - 10

## මල් මාමා එක්ක කතාබහක්
පිටුව - 06

## සියලු බාධා අභියෝග ජයගත් දිරිය දියණිය
පිටුව - 05

ජායාරූපය
එම්. ඒ. සදෙව් සුලක්ෂණ ජයතිස්ස
9 ශ්‍රේණිය
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල

**"e-තරු" අන්තර්ජාල ළමා සඟරාව,**
**ග්‍රාම නිලධාරී කාර්යාලය,**
**මැටි කර්මාන්ත පාර,**
**අඹේපුස්ස.**
**දුරකථන: 0702368628 (whatsapp)**
**Email : etharumagazine@gmail.com**

**- උපදේශකත්වය -**

අඹේපුස්ස ශ්‍රී පෝෂිතාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති

**පූජ්‍ය තියඹරාහේනේ ඥානරතන හිමි**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්

**රංගන සජීව**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්

**කෞෂල්‍යා බණ්ඩාර**

**- සංස්කාරක/ප්‍රධාන කතෘ -**

**චලානි ධිවන්ති හේරත්**

(සංවර්ධන නිලධාරී, අඹේපුස්ස වසම)

**- සම්බන්ධීකරණ සහාය -**

**ප්‍රභාත් සේනාධීර**

(ග්‍රාම නිලධාරී,අඹේපුස්ස වසම)

**ධර්මලතා මුණසිංහ**

(සංවර්ධන නිලධාරී,අඹේපුස්ස වසම)

**චමිලා හෙට්ටිආරච්චි**

(සංවර්ධන නිලධාරී, අල්ගම වසම)

**ශාලිකා රත්නසේන**

(ආර්ථික සංවර්ධන නිලධාරී, අඹේපුස්ස වසම)

**හර්ෂනී ගුණරත්න**

(සංවර්ධන නිලධාරී, ගණිතපුර වසම)

**- විශේෂාංග කතෘ -**

**සංජන වික්‍රමතිලක** (කෑ/ගලිගමුව ම.ම.වි)

**- ප්‍රවෘත්ති කතෘ -**

**සඳුනි උමංෂා රුවන්සිරි**

(කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල)

**- දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු -**

**චතුම් වික්‍රමතිලක** (කෑ/ගලිගමුව ම.ම.වි)

**ඉෂාරා අංජලී** (කෑ/වර/අඹේපුස්ස ම. වි)

**- පරිගණක අක්ෂර හා පිටු සැකසුම -**

**අමිල ග්‍රැෆික්ස්, ගලිගමුව නගරය**

**077 66 98 433**

**- ප්‍රකාශනය -**

වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට අනුබද්ධිත

**අඹේපුස්ස තරු පලස ළමා සමාජය**

# දූවේ පුතේ... හැම දවසක්ම ඔබේ...

දූවේ පුතේ ඔයාලා තවත් එක දවසක් සැමරුවා. ඒ තමයි අවුරුද්දකට එක දවසක් එන ලෝක ළමා දිනය. හැබැයි එක දවසක් සැමරුවට මේ හැමදවසක්ම මගේ දරුවනේ ඔයාලාගේ. ඒ හැම දවසක්ම අපට සමරන්න බැහැ. ඒක අපට සමරන්න පුළුවන් අපේ ජයග්‍රහණත් එක්ක. ඒකට අපි වැඩ කරන්න ඕනෑ. නිර්මාණාත්මක වෙන්න ඕනේ. අලුතින් හිතන්න ඕනේ. අලුත් දේවල් හොයන්න ඕනෑ. ඉගෙන ගන්න ඕනෑ. ඒවා ලෝකෙට පෙන්නන්න ඕනෑ.

මේ "e තරු" අන්තර්ජාල ළමා සඟරාව කියන්නෙත් ඔයාලගේ ඒ හැකියාවන් ලොකේට ගෙනියන්න දරන පුංචි උත්සාහයක්. වසර දෙකකට වැඩි කාලයක් තිබුණු කොරෝනා වසංගතය නිසා ඔයාලගේ ජීවිතේ ලස්සනම පුංචි කාලයක් ඔයාලට අහිමි වුණා. ඒත් දරුවනේ ඉදිරියට එන කාලය හොඳම කාලය කියලා හිතමු. අපි වැඩ කරමු. ඔයාලත් එක්ක අපි හැමෝම ඉන්නවා. අද මේ වගේ පුංචි වැඩ කරන ඔයාලා තමයි අනාගතයේ වැඩිහිටියන් විදියට අපට වැරදුණු තැන් නිවැරදි කරලා මේ පුංචි අපේ රට ලෝකයේ හොඳම රටක් බවට පත් කරන්න ඕනේ. ඔයාලාගේ නැන්දලා මාමාලා විදියට මේ සියලු උත්සාහයන් ගන්නේ ඔයාලා වෙනුවෙන්. මොකද අපට අහිමි වුණත් ලස්සන හෙට දවසක් ඔයාලාට හදලා දෙන්න.

ඉතිං දූවේ පුතේ ඩිජිටල් ලෝකෙත් එක්ක දූන් ඔයාලා එකතු වෙලා ඉවරයි. ඔන්ලයින් පන්ති පාසල්වල වැඩ එක්ක පරිගණක තිරය දුරකතථනය ඔයාලට නුහුරු දෙයක් නෙවෙයි. ඉමක් කොණක් නැති අන්තර්ජාලයේ ඔයාලා ඔහේ එහා මෙහා යනවා. ඒත් දරුවනේ අපි පරිස්සම් වෙන්න ඕනෑ හරි දේ තෝරගෙන කියවන්න බලන්න. අපේ වැඩිහිටියෝ මල් වගේ නොතැලුණු නොකිළිටි හිත් ඇති ඔයාලගේ පිටුපසින්ම ඉන්න ඕනෑ කාලයක්. "e-තරු " කියන්නේ ඔයාලට හොඳ කියවීමක් කරන්න පුළුවන් හොඳ අවස්ථාවක්. ඔයාලා වගේම පුංචි දරුවන්ගේ නිර්මාණ ඔයාලට කියවලා බලලා රස විඳින්න පුළුවන්. කැමතිනම් ඔයාලත් අපිත් එක්ක එකතු වෙන්න. අපට ලියන්න. හොඳ නරක කියන්න. පුංචි ඔයාලගේ අලුත් අදහස් භාර ගන්න අපි හරි කැමතියි.

අපේ "e-තරු" අන්තර්ජාල සඟරාවේ ළමා මාධ්‍යවේදීන් ට පළමුවෙන්ම සුභ පතන්න ඕනෑ. පුංචි ඔයාලා ළමා වෘත්තිකයින් බවට පත් වෙලා. අද ඔයාලාගේ අදහස් ලොකේ හැමෝටම බලන්න පුළුවන්. මීට මාස කිහිපයකට පෙර පුංචියට පටන් ගත්තු තරු පලස ළමා සමාජයේ දරුවෝ ටික පොඩි වැඩ කර කර ඉඳලා එයාලාගේ හැකියාවන් ලොකේටම පෙන්නන්න හදන්නේ. අපි පුංචි කාලේ හීනෙකින්වත් ළඟට යන්න බැරි සමහර චරිත ළඟට ඔයාලා ගිහින් කතා කරලා, තොරතුරු අරගෙන, ලස්සනට නිර්මාණශීලිව ලිපි සකස් කරලා අද මෙහෙම අන්තර්ජාලයේ හැමෝටම බලන්න පුළුවන් විදියට පළ වෙලා. මේ ශක්තිය ඔයාලා දිගටම අරගෙන යන්න.

මොකද මාධ්‍යවේදීයෙක් කියන්නේ හොඳ අසන්නෙක් කියවන්නෙක් වගේම තියුණු විචාරශිලි බුද්ධියක් ඇති ආචාරශිලි අයෙක්. අද මේ "e-තරු" සඟරාවේ පුංචි මාධ්‍යවේදීන් අතර අනාගතයේ දෙස් විදෙස්වල රාජකාරි කරන වෛද්‍යවරු ඉංජිනේරුවරු ගුරුවරු ඉහළ තනතුරු දරන රාජ්‍ය නිලධාරීන් වගේම දක්ෂ මාධ්‍යවේදීන් හා ගත්කතුවරුන් ඉන්නත් පුළුවන්. ඔයාලා අනාගතයේ කුමන තනතුර දැරුවත් පුංචි මාධ්‍යවේදියෙක් විදියට මේ ගන්න පන්නරය ඔයාලා මිනිසුන්ගේ දුක වේදනාව හඳුනන ජාති භේද, ආගම්වලට බින්න නොවන මානව හිතවාදී ආචාරසම්පන්න මිනිසෙකු බවට පත් කරාවි.

ඉතිං දූවේ පුතේ අපේ මේ "e- තරු" අන්තර්ජාල ළමා සඟරාව සාර්ථක ලෙස නිමා කරන්නට බොහෝ අය අප සමඟ සිටියා. මේ අදහස යෝජනා කළ සැණින් හැමදාමත් අපේ නිර්මාණශිලි වැඩවලට ශක්තියක් වන වරකාපොල ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු උපදේශක මඩුල්ලටත් ඉතාමත් විචාරශිලි බුද්ධියක් හා විවෘත මනසකින් හෙබි ඔයාලාව අපත් සමඟ එකතු කරවන ආදරණීය මව්පියන්ටත් හැමදාමත් මුල්‍යමය ප්‍රතිපාදනවලින් උදව් උපකාර කරමින් දැන්වීම් ලබා දුන් ව්‍යාපාරික භවතුන්ටත් ස්තුතිය හිමි විය යුතුය. දරුවන්ගේ නිර්මණශිලි හැකියාවන් මේ ආකාරයෙන් අන්තර්ජාලයේ අකුරු කරන්නට මා හට එදා මෙදා තුර මාධ්‍ය ආභාෂය දුන් ඒ ප්‍රවීණ මාධ්‍යවේදීන්ටත් ප්‍රණාමය හිමි වේවා....

මාගේ සහෝදර රාජ්‍ය නිලධරයිනි ,පාසල්වල විදුහල්පතිවරුනි, ගුරුවරුනි, ආදරණීය මව්පියවරුනි දරුවන් අපත් සමඟ එකතු කරන්න. ඔවුන්ව දිරිමත් කරන්න. ඔවුන්ගේ හැකියාවන්ගෙන් අන්තර්ජාලය අර්ථවත් භාවිතයක් කරමු. මෙහි ගුණ දොස් අපට කියන්න. අපි හැමෝම එකතු වෙලා දරුවන්ව හොඳ අර්ථවත් ගමනක් ගෙන යමු. සිංහල ඉංග්‍රීසි හා දෙමළ භාෂා ත්‍රිත්වයෙන්ම එළිදක්වන අන්තර්ජාල සඟරාවක් බවට පත් කරමු.

**දරුවනේ... හෙට දවස පමණක් නොව අද දවසත් ඔබේ... එක දවසක් පමණක් නොව හැම දවසක්ම ඔබේ....**

**මේ පුංචි උත්සාහයකි. අපි එකතු වුණොත් හැමෝටම මීට වඩා ලොකු දේවල් කරන්න පුළුවන්. ආයෙමත් ආදරෙන් මතක් කරන්නේ...දරුවනේ එන්න... අපි එකතු වෙමු.... අපේ ලෝකය අලුත් කරමු.... ලස්සන කරමු....අපේ හෙට දවස අපිම හදාගමු....**

සංස්කාරක

**චලානි හේරත් (සංවර්ධන නිලධාරී)**

# e - තරු ළමා ලේඛක ලේඛිකාවන්ට සුබාශිංසන

## ගමට එළියක් වුණු තරු පලසේ දරුවෝ



අඹේපුස්ස ශ්‍රී පෝෂිතාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති
**පූජ්‍ය තියඹරාහේනේ ඥානරතන හිමි**

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඹේපුස්ස ග්‍රාම නිලධාරී වසමේ පිහිටුවා ඇති තරු පලස ළමා සමාජය අප ගම්පියසේ මේ වන විට ක්‍රියාකාරීම ළමා සමිතිය බවට පත්ව ඇත. මේ වර්ෂයේදී ළමා සමාජය විසින් සාර්ථක වැඩසටහන් කිහිපයක්ම සිදුකරන ලදී. ගමේ දරුවන්ගේ නිර්මාණ කුසලතාව ඔප් නංවනු පිණිස හා දැනුම බෙදා දීම සඳහා සිදුකරන මෙම අන්තර්ජාල සඟරාවට අප ගමේ ගම්වැසියන්ගේ හා වැඩිහිටි සියලු දෙනා වෙනුවෙන් මම සුබාසිංසනය හා ආශිර්වාදය පුදකරමි.

## කාලීන අවශ්‍යතාවක් ඉටු කරන 'e-තරු'



වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ
සහකාර ප්‍රාදේශීය ලේකම්
**කෞෂල්‍යා බණ්ඩාර**

ළමුන් සඳහා නිර්මාණ කිරීම ඉතා අසීරු කටයුත්තකි. මන්ද ළමයකුගේ සිතුම් පැතුම් වැඩිහිටි රචකයකුගේ පරිකල්පන සීමාවෙන් බොහෝ ඈත නිසාය. හුදු ලාභය පමණක් පෙරදැරි කරගත් ළමා මනස විකෘති කරවන නිර්මාණ ඇති වටපිටාවක, ළමුන්ගේ පරිකල්පන හැකියාව අවදි කරවමින් ඔවුන්ගේ සිතුම් පැතුම් පිළිබිඹු කිරීමට අන්තර්ජාල අවකාශයක් නිර්මාණය කිරීම කාලීනය. නිර්මල ළමා මනසක් සහිත අපේ දරුවන් අනාගතයේ ප්‍රචණ්ඩත්වය, වාර්ගිකත්වය අභිබවමින් මානව දයානුකම්පාව පිරි නිර්මාණශිලි මිනිසුන් බවට පත් කිරීමට "e-තරු " සඟරාව සහයක් වේවායි මම සුබ පතමි.

## කියවීමෙන් දුරස්වුණු ළමා ලෝකයට තරු පලසේ දරුවන් ආදර්ශයක්



කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ
ජනමාධ්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

වර්තමාන ළමා පරපුර තොරතුරු ප්‍රමුඛ කොටගත් විශ්ව සමාජයක ජීවත්වන අතර ඔවුන් කියවීමෙන් දුරස්ථ වී සිටියි. ඒ නිසා ළමුන්ගේ වටහා ගැනීමේ අවබෝධනය හා විමර්ශන හැකියාව වේගයෙන් පිරිහීමට ලක් වී පවතියි. එම තත්ත්වය ඔවුන්ගේ අනාගතයේ බරපතළ ගැටලු ඇති කිරීමට හේතු වේ. මෙවැනි වටපිටාවක් තුළ දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි. ඒ සඳහා කියවීම, විමසීම, නිරීක්ෂණය සහ නිර්මාණ කිරීමට ඔවුන්ව පෙළඹවීම කළ යුතු වේ. එය වැඩිහිටි සැමගේ වගකීමකි. යුතුකමකි. ඒ සඳහා තරුපලස ළමා සමාජය විසින් ආරම්භ කර ඇති මේ අන්තර්ජාල සඟරාව කාලීන හා ජාතික අවශ්‍යතාවක් ලෙස දකින අතර එයට මාගේ සුබාසිංසන මෙලෙස පිරිනමමි.

## සංවේදී මිනිසුන් හදන වෑයම සාර්ථක වේවා



ප්‍රවීණ ලේඛිකා
**කරුණා පෙරේරා**

දරුවන්ට පහසුවෙන් ඇවිද යා හැකි බුමුතුරුණු සකසා දීම වැඩිහිටියන්ගේ වගකීමයි. ඒ දරුවන්ගේ දැනුම නුවණ මෙන්ම හැඟීම් ඇති මිනිසුන් ලෙස සමාජයට යා යුතුය. ඒ සඳහා මුල් පියවරක් තබන තරු පලස ළමා සමාජයේ 'ඊ තරු' ළමා සඟරාවට දැනුම නුවණ මෙන්ම හැඟීම් ඇති කඳුළක සිනාවක සැඟවුණු තේරුම් දැන කියා ගන්නා හා එවායින් සසලවන සිත් ඇති පරපුරක් බිහිකරන්නට ගන්නා වෑයම සාර්ථක වේවායි මගේ හිතාදර ප්‍රාර්ථනයයි.

## නිර්මාණශිලී ළමා මාධ්‍යවේදීන්ට ඉතා හොඳ ඉඩක්



වරකාපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ
ප්‍රාදේශීය ලේකම්
**රංගන සජීව**

අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අඹේපුස්ස ග්‍රාම නිලධාරී වසමේ සාර්ථක අන්දමින් පවත්වාගෙන යනු ලබන තරු පලස ළමා සමාජයේ මෙලෙස එළි දක්වන "e- තරු" ළමා සඟරාවට මම පළමුවෙන්ම සුබ පතමි. වත්මන් අර්බුදකාරී වටපිටාවක මාධ්‍ය ශක්‍යතාවයන් හඳුනාගනිමින් දරුවන්ගේ නිර්මාණශිලී අදහස්වලට මෙලෙස නිදහස් ඉඩකඩක් සකසා දීම ඇගයිය යුතුමය. අනාගතයේ කියවන සමාජයක් මෙන්ම දැනුමෙන් නුවණින් පිරි ගවේශනාත්මක හා නිර්මාණශීලී ළමා මාධ්‍යවේදීන් "e-තරු" සඟරාවෙන් බිහිවේවායි ප්‍රාර්ථනා කරමි.

## වැඩිහිටියන්ගේ මගපෙන්වීම ඉතා විශිෂ්ටයි



විජය ළමා පුවත්පතේ හිටපු කර්තෘ
**පියල් උදය සමරවීර (මල් මාමා)**

රටේ අධ්‍යාපනය ඇතුළු සියල්ල අර්බුදයකට ලක් වී ඇති මොහොතක දරුවන්ගේ දැනුම ආකල්ප හා කුසලතා වැඩි දියුණු කරන මෙවලමක් ලෙස මෙවැනි සඟරාවක අවශ්‍යතාව කාලීනය. එය අලුත් තාක්ෂණය මුසු වූ අන්තර්ජාල සඟරාවක් හරහා ළමා සමාජයක දරුවන් අතරින්ම බිහි වීම විශේෂයි. තාක්ෂණයේ දියුණුව යහපත් අරමුණකට යොදා ගනිමින් දරුවන්ව අලුතින් හිතන්න යොමු කරන මේ වෑයම පිටුපස සිටින වැඩිහිටියන්ට මම ප්‍රසංසා කරන අතර ඉදිරියේදී තව තවත් අත්දැකීම් ලබමින් සාර්ථකව මේ කර්තව්‍යය කරගෙන යන්නට ලැබේවායි මම දරුවන්ට සුබ පතමි.

## දරුවන්ගේ ලෝකය තව තවත් සුන්දර වේවා..!



ප්‍රවීණ ලේඛිකා
**ජානකී සූරියආරච්චි**

දරුවන්ගේ ලෝකය බොහොම පිවිතුරුයි. ප්‍රභාෂ්වරයි. ඒත් ඒ පුංචි දරු පැටව් ලොකු වෙන කොට වැඩිහිටියන්ගේ ලෝකය දකින කොට ඒ පුංචි හිත් ටිකෙන් ටික කිලිටි වෙන්න පුළුවන්. ඒත් ඒ පිවිතුරුබව ප්‍රභාෂ්වරබව ගිලිහෙන්න නොදී දිගටම ඒ වගේම හැමදාම තියාගන්න නම් දරුවාගේ ළමා කාලය පමණක් නොව ඔවුන් වැඩෙන මාවත සුන්දරත්වය ගිලිහෙන්න නොදී ඇද බැඳ තබාගන්න අවශ්‍යයි. ඒ සඳහා කළ හැකි දේ බොහොයි. විශේෂයෙන් ඔවුන් සමග පියවරෙන් පියවර ළමා කාලය නව යොවුන් විය හරහා වැඩිහිටිවිය දක්වාව ගමන් කරන නිර්මාණාත්මක වගේම ගුණාත්මක ක්‍රියාවලියක් අවශ්‍යයි. ඒ වෙනුවෙන් අනාගත ලෝකය ලස්සන කිරීමට ජනමාධ්‍ය කලාවට කළ හැකි දේ අපමණයි. යහපත් ජනමාධ්‍ය කලාවක් සංවේදී ලිවීමේ කලාවක් දරුවන් තුළින්ම ඉදිරියට ගෙනයාමට දරන වටිනා උත්සාහය දිනෙන් දින සාර්ථක වී දරුවන්ගේ ලෝකය තව තවත් සුන්දර වෙන්නට මගේ ආදර සුබපැතුම්....

උපදෙස් -
අබේපුස්ස ශ්‍රී පෝෂිතාරාම බෞද්ධ මධ්‍යස්ථානාධිපති
පූජ්‍ය තියඹරාහේනේ ඥානරතන හිමි

## මව්පියන්ට සැලකූ ගිරවා



ඔන්න එකෝමත් එක කාලෙක ගිරව් රංචුවක් සිටියා. මේ ගිරව් රංචුව හැමදාම වී ඇට කන්නට කුඹුරට එනවා. කුඹුර අයිති ගොවි හාමි හරිම හොඳ කෙනෙක්. මේ ගිරවින්ට කුඹුරේ වී ඇට කන්නට දීලා බලා ඉදලා තමයි ගිරව් ටික එළවන්නේ. හැමදාමත් එන ගිරව් රංචුවේ එක ගිරවෙක් විතරක් වී කරලක් හොටින් අරගෙන තමයි ඉගිළිලා යන්නේ. මේක දැකපු ගොවි හාමිට හොඳටම තරහා ගියා. මේ ගිරවා වී ඇට කාලා බඩ පුරෝගන්නවා විතරක් නෙවෙයි වී කරල් අරගෙනත් යනවා. මෙහෙම හිතපු ගොවි හාමි දවසක් ඒ ගිරවා අල්ල ගත්තා. "අනිත් ගිරවුන් වී කාලා බඩ පුරෝගෙන යන්නේ. උඹ වී කාලා බඩ පුරෝගෙන ඇයි වී කරල් අරගෙනත් යන්නේ" ගිරවා හොඳටම බය වුණා. "අනේ ගොවි හාමි මට සමාවෙන්න. මගේ අම්මයි තාත්තායි හොඳටම වයසයි. එයාලට ඉගිලෙන්නත් බැහැ. ඒ දෙන්නට කන්න තමයි මම හැමදාම වී කරලක් ගෙනියන්නේ. ගොවි හාමිට හොඳටම දුක හිතුණා. ඊට පස්සේ ගොවි හාමි ගිරවට මෙහෙම කිව්වා.

"අම්මා තාත්තා රකින පුතේ
උතුම් ගුණය තව වඩනු පුතේ
කුඹුරම දෙන්නම් නුඹට පුතේ"



අපේ බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍රයේ දේශනා කළේ මව්පියන්ට උපස්ථාන කිරීම මහා මංගල කරුණක් බවයි. බුදු රදුන් අපේ මව්පියන් හැඳින්වූයේ " බුද්ධෝ විය පිතා බුද්ධෝ විය මාතා" ලෙසයි. ඒ මව හා පියා බුදුන් හා සම බව උන්වහන්සේ දේශනා කළහ. මව්පියන් රැකබලා ගැනීම ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම දරුවන්ගේ යුතුකම හා වගකීම බව තවද උන්වහන්සේ මැනවින් දේශනා කළ සේක. ඒ නිසා පුංචි අපි හැමදෙනාගේම වටිනාකම වන්නේ මේ සාලිකේදාර ජාතක කතාව ඇසුරු කරගෙන මව්පියන්ට සැලකීම ඉතා උතුම් වූ ආනිසංස ගෙන දෙන ඉතා උසස් කටයුත්තක් බව සිහි තබා ගැනීමයි.

ඔබ සැමට තෙරුවන් සරණයි.

සටහන
ඒ.පී. සනුලි ලිසාරා වික්‍රමතිලක
5 වසර
කෑ/ඩඩ්ලි සේනානායක ම.ම.වි.

# දැහැමි තරුව

උපදෙස් -
ශ්‍රී දේවගිරි රජමහා විහාරයේ විහාරාධිපති,
වරකාපොල ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ
ප්‍රධාන ලේඛකාධිකාරී,
පූජ්‍ය පලිපානේ ශ්‍රී විමලධර්ම නාහිමි

## අපේ ගෙවත්තට දන්සලක්

### කුරුලු ලෑල්ලකින් පිං රැස් කරගන්නෙ මෙහෙමයි

පුංචි අපි සෑම විටම අනිත් අයට යහපතක් වෙන විදියට වැඩ කරමු. අපි කරන පුංචි දෙයක් තව අයකුට වටිනා දෙයක් විය හැකියි. අපේ ජීවිතය හරිම කෙටියි. ඒ වගේම තාවකාලිකයි. ඒ නිසා අපි හැම මොහොතකම පින් රැස් කරගනිමු.

බුදුරදුන් පවා බුද්ධත්වයට පත් වූයේ දාන පාරමිතාව පදනම් කරගෙනයි. අපි බුදු තෙමඟුල සිහිපත් කරමින් නොයෙක් දාන මාන පිංකම්වල නිරත වන්නෙමු. ඒ අතර දන්සල් ප්‍රධාන තැනක් ගනී. දන්සලකින් ලැබෙන ආනිසංස බොහෝය. පුංචි අපිටත් නිවසේදීම දන්සලක් දීමට පුළුවන. ඒ සතුන්ට කෑම ලෑල්ලක් සකස් කර දීමෙනි. එවැනි කුරුලු කෑම ලෑල්ලක් නිවසේ වයඹ හෝ ගිණිකොණ දිසාවන්වල සැකසීම වඩාත් සුදුසු බව පැරැන්නන්ගේ අදහසයි. කුරුල්ලන්ට ආහාර සහ වතුර ලබා දීමෙන් ශරීරයට ශක්තිය ලැබේ. නෑම සඳහා ජලය ලබා දීමෙන් ලෙඩ රෝග සුව වේ. පැණි රස ආහාර ලබා දීමෙන් නිවසේ සතුට ඇති වේ. රසවත් ආහාර ලබා දීමෙන් ඉක්මන් දියුණුව ද සිර කර ඇති කුරුල්ලන් නිදහස් කිරීමෙන් මානසික සතුට ඇති වේ. බීමට ජලය තැබීමේදී සීනි ස්වල්පයක් එකතු කිරීම වඩාත් සුදුසුය. පිලුණු වූ සහ මස් මාංශ තැබීම කිසි විටකත් සිදු නොකරන්න.

පුංචි අපිත් ගෙදර හැමදාම දන්සලක් කර ගනිමු. එවිට අපට පින් වගේම සතුටින් සපිරි ලස්සන ගෙවත්තක් ලැබෙනු ඇත.

සටහන
කේ.කේ. අමීෂ මිලාන් කරිවිලකන්ද
9 වසර
කෑ/වර/අබේපුස්ස ම.වි.



# මොන තනතුර දැරුවත් රටට සේවය කරන්න



වරකාපොල ප්‍රාදේශීය ලේකම්

## රංගන සජීව අත්තනායක

**රාජ්‍ය සේවා වලින් සේවා සපයන බිම් මට්ටමේ පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. මහජනතාවට සේවා සැපයීම මෙන්ම සංවර්ධන කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය එහි වගකීමයි. ඒ සියලුම කටයුතු වලට නායකත්වය සපයන රාජ්‍ය නියෝජිතයා ප්‍රාදේශීය ලේකම්ය. දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 322 කි. ඒවාට නායකත්වය දෙන ප්‍රාදේශීය ලේකම්වරු තුන්සිය විසි දෙදෙනෙකු සිටී. ඔහු ද ඒ අතරය. ඒ අප ප්‍රදේශය නියෝනය කරන වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් රංගන සජීව අත්තනායකයි. මේ "E තරු" ඔහුත් සමඟ කළ කතා බහයි.**

● **සම්පූර්ණ නම ?**

අත්තනායක මුදියන්සේලාගේ රංගන සජීව අත්තනායක

● **උපන් ගම ?**

ලුණුගල

● **පවුලේ විස්තර ?**

මගේ පවුලේ අම්මයි, තාත්තයි, මමයි, මල්ලිලා දෙන්නයි. මගේ තාත්තා ඒ.එම්. සෙනවිරත්න ඔහු සේවය කළේ රක්ෂණ සංස්ථා නියෝජිත වරයෙක් විදියට. අද ඔහු ජීවතුන් අතර නැහැ. අම්මා ඩී. එම්. ලීලාවතී. ඇය විශ්‍රාමික බැංකු නිලධාරිනියක්. මගේ ලොකු මල්ලි බැංකු කළමනාකරුවෙක් විදියට සේවය කරනවා. අනෙක් මල්ලි ව්‍යාපාරිකයෙක්. මගේ බිරිඳ ශමිලා සේනානායක. ඇය කළමනාකරණ සේවා නිලධාරිනියක් විදියට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරනවා.



● **ඉගෙන ගත් පාසල ?**

මම මුලින්ම පාසල් ගියේ ලුණුගල මධ්‍ය විද්‍යාලයට. ශිෂ්‍යත්වය සමත් වෙලා බදුල්ල මැදි විදුහලට ගියා.

● **මේ වන විට ලබා ඇති උපාධි මොනවද ?**

මගේ පළමු උපාධිය කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රම අධ්‍යාපනය පිළිබඳව ලැබුවා. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලබා ගත්තා. සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්ව විද්‍යාලයෙන් ලබා ගත්තා.

## මවුපියන්ට කීකරු වෙන්න

● **ඔබ විවේක වෙලාවට මොකද කරන්නේ ?**

මම හුගක් පොත් කියවන කෙනෙක්. චිත්‍රපට බලනවා. සිංදු අහනවා.

● **කැමතිම පොත මොකක්ද ?**

කැමැත්ත කාලෙත් එක්ක වයසත් එක්ක වෙනස් වෙනවා. ඒ නිසා එක පොතක් කියලා කියන්න බැහැ.

● **මේ දවස්වල කැමතිම පොත ?**

තිසල් ඒකනායකගේ බිෂොප්.

● **ප්‍රාදේශීය ලේකම් දක්වා රාජ්‍ය සේවයේ පැමිණි ගමන් මග කිව්වොත් ?**



මම මුලින්ම එකතු වෙන්නේ ලිපිකරු සේවයට. එතකොට මගේ වයස අවුරුදු 20 යි. මගේ බලාපොරොත්තුව තිබුණේ චාර්ටඩ් එකවුන්ටන් කෙනෙක් වෙන්න. ඒ නිසා ලිපිකරු සේවයේ ඉන්න කාලේ මම චාටර්ඩ් එකවුන්ටන් කෙනෙක් වෙන්න ඉගෙන ගත්තා. ඒත් එක්කම මම කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත් ලබා ගත්තා. ඊට පස්සේ බදු නිලධාරී විභාගයෙන් සමත් වෙලා බදු නිලධාරිවරයෙක් විදියට සේවය කළා. ඒ ඉන්න කොට මගේ අම්මා කිව්වා ඔයා පරිපාලන විභාගය කරන්න කියලා. ඊට පස්සේ පරිපාලන සීමිත විභාගයෙන් සමත් වෙලා පරිපාලන සේවයට එකතු වුණා.

● **ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්ය භාරය මොකක්ද ?**

ප්‍රාදේශීය ලේකම්වරයෙකුට රාජකාරි 160 ක් තියෙනවා. ප්‍රාදේශීය වශයෙන් රජයේ සිටින නියෝජිතවරයා තමය ප්‍රාදේශීය ලේකම් කියන්නේ. රජයේ සහ අමාත්‍යාංශවල කටයුතු නියෝජනය කරලා සියලුම කටයුතු කාර්යයන් ගමට ගෙනියන්නේ ප්‍රාදේශීය ලේකම්වරයා.

● **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ජනතාවට ලැබෙන්නේ මොනවගේ සේවාවක්ද ?**

පුද්ගලයකුගේ උපතේ සිට මරණය දක්වා කටයුතු සිදු කෙරෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හරහා. උප්පැන්න, මරණ ලියාපදිංචි කිරීම, දුප්පත් අයට ආධාර දීම, සමාජසේවා කටයුතු, සංවර්ධන කටයුතු, පෙර පාසල් අධීක්ෂණය, උපදේශන සේවා ලබා දීම, ගං වතුර ආදී තත්ත්වවලදී ආපදා සහනාධාර ලබා දීම,වාහනවල ආදායම් බලපත නිකුත් කිරීම, කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම, ග්‍රාම සංවර්ධන සේවා දියත් කිරීම වගේ තවත් කටයුතු රාශියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වෙනවා.

● **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ළමයෙකු සම්බන්ධව තියෙන්නේ මොනවගේ වගකීමක්ද ?**

දරුවෙක් අයිති රටට. මවුපියන් දරුවෙක් බලාගත්තට දරුවකුට හැදෙන්න අවශ්‍ය යහපත් වටපිටාව සකසා දීමේ වගකීම තියෙන්නේ රජයට. රජයේ කටයුතු ප්‍රාදේශීයව නියෝජනය කරන ආයතනය විදියට ඒ වගකීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වෙනවා. ගැබිනි මවකට පෝෂණ මුද්දරය නිකුත් කිරීමේ සිට ඒ දරුවා රැකියාවකට යොමු කිරීම දක්වා වගකීමක් ප්‍රාදේශීය ලේකම් කාර්යලයකට තියෙනවා. අපේ කාර්යාලයේ ළමා හිමිකම් නිලධාරීන් විසින් මවුපියන් නැති දරුවන් හා අනාරක්ෂිත වටපිටාවක ඉන්න දරුවන් පරිවාස භාරයට පත් කිරීම, වැරදි මංපෙත්වලට යොමු වී ඇති දරුවන්ට උපදේශන සේවා ලබා දී යහ මගට ගැනීමට කටයුතු කරනවා.

● **ළමා සමාජයක් පිළිබඳ තියෙන අදහස මොකක්ද ?**

ළමා සමාජයක් කියන්නේ සෑහෙන කාලෙක ඉඳන්ම ලෝකෙ පුරාම තිබෙන ඉතා හොඳ සංකල්පයක්. ළමයින් සමාජයත් එක්ක තිබෙන සබඳතා දියුණු කරලා පෞරුෂ සංවර්ධනයක් ඇති කිරීම ළමා සමාජයක් හරහා සිදුවෙනවා. ඒ වගේම තමන්ගේ දක්ෂතා හඳුනාගෙන ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙන නිසා වැරදි වැඩවලට යොමු වෙලා කැපී පෙනෙන්න උත්සාහ ගන්නවට වඩා තමන්ගේ හැකියාවන්ගෙන් කැපී පෙනෙන්න උත්සාහ ගන්නවා. ඇත්තටම නිසි මගපෙන්වීමෙන් සමාජය එක්ක වැඩ කරලා සමාජය ගැන අවබෝධයක් දරුවෙක්ට ලැබෙන නිසා වැරදි මාර්ගයට යාමට ඇති ඉඩකඩ ළමා සමාජය හරහා අඩු වෙනවා.

● **ළමා සමාජයකට සම්බන්ධ වීමෙන් දරුවකුට ලැබෙන්නේ මොනවගේ වටිනාකමක්ද ?**

සාමූහිකව වැඩ කරන හොඳ නායකයෙක් ළමා කාලයේ ඉඳන්ම තමන් තුළ නිර්මාණය වෙන නිසා කුමන රැකියාව කළත් සමාජයේ හොඳ දරාගැනීමේ ශක්තියක් ඇති සාර්ථක පුද්ගලයෙක් බවට පත් වෙන්න පුළුවන්.

● **අද වගේ අර්බුදකාරී වටපිටාවක අධ්‍යාපනය ලබන අප වගේ දරුවන්ට ඔබ දෙන පණිවුඩය මොකක්ද ?**

මේ වගේ අර්බුදකාරී තත්ත්වවලට අපි පුංචි කාලෙත් මුහුණ දුන්නා. මට කියන්න තියෙන්නේ දරුවනේ ඔයාලා හොඳට ඉගෙන ගන්න. මවුපියන්ට කීකරු වෙන්න. අනවශ්‍ය දෑ මවුපියන් ගෙන් ඉල්ලලා කරදර කරන්න එපා. මොකද අද වගේ කාලෙක මවුපියන් ඉන්නේ ලොකු පීඩනයකින්. ඔයාලට කන්න බොන්න දීලා පාසල් යවලා බලාගන්නේ ලොකු කැපකිරීමක් කරලා. ඒ වගේම යම් යම් කුසලතා වැඩි දියුණු කරගන්න. මේ දවස්වල ඔයාල පුළුවන් හැම තැනකම වගා කරන්න. එකෙන් මවුපියන්ගේ ආර්ථිකයටත් ඔයාලට ශක්තියක් වෙන්න පුළුවන්.

● **ඊළඟ ඉලක්කය මොකක්ද ?**

ඉහළ තනතුරකට යාම තමයි. හැබැයි මම කුමන තනතුර දැරුවත් රටට සේවය කරමින් මහජනතාවට උපරිම සේවාවක් ලබා දීම මගේ අරමුණ.

## මේ දවස්වල අනවශ්‍ය දෑ ඉල්ලන්න එපා

## පුතාලා, දූලා වෙනුවෙන් හැමදාමත් අපි ඉන්නවා



සටහන - සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක, 9 - C
ඡායාරූප - චතුම් රශ්මිත වික්‍රමතිලක, 7 - C
කෑ/ගලිගමුව ම. ම. වි.






**ඉතා දුක්බර කතා මාධ්‍යයෙන් නිතර ඇසීම අපට හුරුපුරුදුය. ලෝකයේ ආබාධිත , දුප්පපත් හා අසරණ අයට අනෙකාගෙන් උදව් අවශ්‍යය ය. ඒත් එවැනි අඩුපාඩු පන්නරය කරගනිමින් ජයග්‍රහණ කරා යන පුද්ගලයෝ ද අප අතර සිටියි. එවැනි කතා අපට මාධ්‍යයෙන් ඇසෙන්නේ ඉතා කලාතුරකිනි. සැබෑ වීරයන් වන්නේ ඔවුන්ය. එවැනි තවත් වීරවරියකගේ කතාවකි මේ.**



# සියලු බාධා අභියෝග ජයගත් දිරිය දියණිය නටාලි ඩු ටොයිඩ්

දකුණු අප්‍රිකානු නටාලි ඩු ටොයිඩ් උපත ලැබුවේ 1984 ජනවාරි 29 වැනි දින කේප් ටවුන්හි දීය. ඇය කුඩා කාලයේදී අසනීප රැසකින් පීඩා විඳි දූරියක් වූවාය. දූඩි සේ පිඩා වින්දේ ඇදුම රෝගයෙනි. දිනක් ඇදුම රෝගය උත්සන්න වී මරණාසන්න විය. ඇයගේ මව්පියන් පවසන්නේ ඒ ගැන පවසන්නේ මෙලෙසිනි.

"ඇත්තටම අපි හිතුවේ නටාලියා අපිව දාලා යාවි කියලා. ඒ තරමටම ඇය හුස්ම ගැනීමට අපහසුව සිහිසන් වුණා. දෙවියෝ අපිට ආයෙමත් නටාලියාව දුන්නා. "

ඇදුම රෝගයට පිළියමක් ලෙස නටාලියාගේ මව්පියන් ඇයව පිහිනීම සඳහා යොමු කෙරීය. එයද ඉතාමත් දුෂ්කර කාර්යක් විය. මන්ද ඇය ජලයට බිය වී පිහිනුම් තටාකයට බැසීමට පවා ප්‍රතික්ෂේප කිරීමයි. අසිරී වෑයමකින් පසු ඇයව පිහිනීම සඳහා යොමු කිරීමට ඇයගේ මව්පියන්ට හැකිවිය. ඒ වන විට ඇයගේ වයස 6 කි.

මාස කිහිපයක් ඇය පිහිනීමේ නිරත වී සිටින විට ඇයගේ ඇදුම රෝගයද යථා තත්ත්වයට පත් විය. සම වයසේ දරුවන්ට වඩා ඉදිරියෙන් ඇය පිහිනුම් ක්‍රියාවලියේ යෙදුණි. රෝගී පෙනුමෙන් මිදුණු ඇය පාසලේ අධ්‍යාපන වැඩකටයුතු වලද වෙනදාට වඩා උනන්දුවෙන් යෙදුණාය. වයස දහය පමණ වන විට තම වයස් කාණ්ඩයේ සියලුම පිහිනුම් වාර්තා බිඳ දැමුවාය. වයස අවුරුදු දාහතර වන විට ඇය දකුණු අප්‍රිකාවේ ඉදිරියෙන් සිටින වඩාත්ම කැපී පෙනෙන පිහිනුම් ශූරියක් වූවාය.

එසේ නව යොවුන් වියට එළඹෙනවාත් සමග ඇය ඉතාමත්ම අභාග්‍යය සම්පන්න ඉරණමකට ලක් විය. ඒ වයස 18 වන විට ඇයගේ ජීවිතයේ සුන්දරම අවධියේදී ස්කූටර් අනතුරකට ලක් වීමයි. අනතුරින් ඇයගේ වම් පාදය දරුණු ලෙස තුවාල වූ අතර වෛද්‍යවරුන්ට එය දණහිසෙන් කපා දැමීමට සිදු විය. ඒත් අනතුරෙන් පසු නටාලි විශාල ධෛර්යයක් සහ අධිෂ්ඨානයක් පෙන්නුම් කළාය. බොහෝ දෙනකුට කෘතිම පාදයක් සමග ඇවිදීමට වසරක් පමණ ගත වන නමුත් නටාලි රෝහල් කොරිඩෝවේදී පුහුණුවීම් කළ අතර පැය පහකින් පමණ ඇවිද ගියාය.

නටාලි ගේ ආත්ම විශ්වාසය බිඳ දැමීමට කවුරුත් සමත් නොවීය. තුවාල සුව වූ පසු ඇය නැවතත් පිහිනීමට පටන් ගත්තාය. හරියටම අනතුර සිදු වී මාස දහ අටකින් පසු නටාලි පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සහභාගි වූවාය. එහිදී පිහිනුම් මීටර් 50 හා මීටර් 100 ආබාධිත නිදහස් ආර පිහිනුම් ඉසව්වෙන් ලෝක වාර්තා දෙකක් බිඳ දමා රන් පදක්කම දිනා ගත්තාය. ඇය අවසන් මහා තරඟයටද පැමිණියාය. එපමණක් නොව දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා සමගාමීව කිලෝමීටර් 10 ක විවෘත ජල පිහිනුම් ඉසව්වට ඉදිරිපත් වූ අතර සහභාගි වූවන් 25 දෙනාගෙන් 16 වැනි ස්ථානයට පත් විය. විටෙක මාධ්‍යය ඇයගෙන් ඒ ජයග්‍රහණ හා ආබාධිත තත්ත්වය පිළිබඳ විමසූ විට ඇය දෙන්නේ මෙවැනි පිළිතුරකි.


"ජීවිතයේ සෑම අත්දැකීමක්ම මිනිසුන්ට ඉගෙන ගත හැකියි. මට අනුකම්පාවක් අවශ්‍යය නැහැ. හැබැයි මට සමහර වෙලාවට ලොකු දුකක් දැනෙනවා. ඒ ඇයි කියලා මට තේරුම් ගන්න බැහැ. ඒ වෙලාවට මම කරන්නේ වතුරට බහින එක. එතකොට මගේ දුක ඔක්කොම නැති වෙලා යනවා. මම කැමැති නැහැ සමාජශීලි වෙන්න. වතුර ඇතුළේ මට තනි වෙලා ඉන්න පුළුවන්."

නටාලි විශිෂ්ඨ පිහිනුම් ක්‍රීඩිකාවක් පමණක් නොව දකුණු අප්‍රිකාවේ මෙන්ම ලෝකයේ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන විශිෂ්ඨ කථිකයෙකි. ඇය පවසන්නේ ආබාධිත පුද්ගලයන් සඳහා රජයෙන් හා ලෝක සංවිධානවලින් තවත් බොහෝ දෑ කළ යුතු බවයි. ඔවුන්ට ඉගෙනීමට රැකියා ලබා ගැනීමට සහ ක්‍රීඩා කිරීමට උදව් කළ යුතු බවට ලෝකයට හඬ ගා පැවසීමට ඇය දැඩි උත්සහයක් ගනියි. තමන්ගේම ගැටළු ජය ගැනීමට ඇය සතු අධිෂ්ඨානය නිසැකවම අපට ද මහත් ධෛර්යයක් ලබා දෙනු ඇත .

තවිරු මෙරාජ්
11 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල



"ජීවිතයේ හැම අත්දැකීමකම ඉගෙන ගන්න දෙයක් තියෙනවා"






# "මල් මාමා" එක්ක කතාබහක්



විජය ළමා පුවත්පතේ හිටපු කතෘ

## පියල් උදය සමරවීර මහතා

**වසර 1954 දෙසැම්බර් 19 වැනි දින උපත ලැබූ ඔහු උසස්පෙළ දක්වාම අධ්‍යාපනය ලැබුවේ මාතර රාහුල විද්‍යාලයෙනි. කුඩා කාලයේ සිටම නිර්මාණකරණයේ යෙදුණු ඔහු චිත්‍ර ශිල්පියකු, රූපවාහිනී ළමා නාට්‍ය පිටපත් රචකයෙකු හා ළමා ගීත රචකයෙකු ද වේ. සුරතල,ලංකාදීප හා තරුණයා ආදී පුවත්පත්වල චිත්‍ර ශිල්පියා ලෙසත් දශක ගණනාවක් සේවය කළේය. 2010 වසරේ දී හොඳම ළමා සාහිත්‍ය කෘතියට හිමි රාජ්‍ය සම්මානය "පරණ තොප්පිය" කෘතිය වෙනුවෙන් දිනාගත්තේ ද ඔහුය. මේ දශක හතරක් තිස්සේ විජය ළමා පුවත්පතේ මකාගේ යලක් හි මල්මාමා චිත්‍ර කතාවෙන් බාල මහලු කා අතරත් මල් මාමා නමින් ජනප්‍රිය ඔහු පියල් උදය සමරවීර මහතායි.**

**පියල් මාමේ ඔබ කොහොමද මල් මාමා වුණේ?**

මම විජය පුවත්පතට 1980 දී තමයි සම්බන්ධ වුණේ. එතකොට මං "මකාගේ යලක් "කියලා චිත්‍ර කතාවක් පටන් ගත්තා . එකේ ප්‍රධාන චරිතය මල් මාමා. ඇත්තට ලොකු පොඩි හැමෝම ඒ කතාවට ආකර්ෂණය වුණා. ඒ නිසා වෙන්න ඇති මාව මල් මාමා විදියට ජනප්‍රිය වුණේ.

**"මකාගේ යලක් "චිත්‍ර කතාවේ මල් මාමා චරිතය මාමාගේ හිතට ආවේ කොහොමද?**

පත්තර කැල්ලක මම දැක්කා නහයේ මලක් ඇඳපු මනුස්සයෙක්ගේ චිත්‍රයක්. ඊට පස්සේ මට හිතුණා ඒකට කතාවක් හදන්න ඕනේ මේ මල ආවේ කොහොමද කියලා. එහෙම හිතලා තමයි යකාගේ මලක් මකාගේ යලක් කියලා චිත්‍ර කතාව අඳින්න ගත්තේ.

**එතකොට මල් මාමා කොහොමද පුවත්පත් කලාවට එකතු වුණේ?**

මම පුංචි කාලේ ඉඳන්ම ලියනවා අඳිනවා. මට මතකයි ඒ කාලේ පොඩි පොතක් හදලා එකේ චිත්‍ර ඇඳලා කතාවක් ලියලා යාළුවන්ට දෙනවා බලන්න. ඊට පස්සේ මිහිර පත්තරේ ළමා පිටුවට ප්‍රහේළිකා කතන්දර හදලා  තැපැල් කරනවා. ඉතිං පත්තරේ පළ වෙන මගේ නිර්මාණ දැකලා මට යාළුවෙක් අන්න විජය සමාගමෙන් අලුත් පත්තරයක් පටන් ගන්නවා ගිහින් බලන්න කියලා. ඊට පස්සේ මගේ නිර්මාණත් අරගෙන මම ඉන්ටවිව් එකට ගියාම මට ඒ පත්තරේ වැඩට එන්න කිව්වා.

**මල් මාමාට රැකියාවේදී තිබුණේ මොනවගේ බාධකද?**

එහෙම බාධා නම් මට ආවේ නෑ. මොකද මම හරිම ආසාවෙන් උනන්දුවෙන් රැකියාව කළා. මම විජය සමාගමේ ම පුවත්පත් කිහිපයක ප්‍රධාන චිත්‍ර ශිල්පියා විදියට වැඩ කළා.  මම විශ්‍රාම ගියේ විජය ළමා පුවත්පතේ ප්‍රධාන කතෘවරයා විදියට වසර ගණනාවක් සේවය කරලා.

**චිත්‍ර කතා තමයි මල් මාමා වැඩිපුරම අඳින්නේ. ඒ ඇයි?**

මට හොඳට අඳින්න පුළුවන් නිසා ඉතිං චිත්‍ර අඳිනවා. චිත්‍ර අඳින්න පුළුවන් අය ගොඩක් අඩුයි. කතාවක් ලියන කොට සිද්ධියක් විස්තර කරන්න ගොඩක් ලියන්න ඕනෑ. චිත්‍ර කතාවක එහෙම නැහැ. චිත්‍ර එක්ක කතාව ලියන කොට පාඨකයාට ගොඩක් දේවල් කියන්න පුළුවන්. ඒ වගේම පාඨකයා දෙයක් හිතලා තමයි රස විඳින්නේ.

**පුංචි අපි නිර්මාණයක් කරනවා නම් කොහොමද ආරම්භයක් ගන්නේ?**

මුලින්ම ඔයාලා හිතන්න මම හොඳ කතාවක් ලියනවා කියලා. ඊට පස්සේ ලියන්න. ඒක ලස්සනට පිටකවරයක් නමක් දාලා ගුරුවරයෙකුට දෙන්න බලන්න. එතකොට ඔයාලාගේ තව අඩුපාඩු ඒ අය හදයි. ඒ අඩු පාඩු හදාගෙන පුවත්පතක ළමා පිටුවට නිර්මාණ යොමු කරන්න. ඔයාලගේ නිර්මාණ හොඳයි නම් අනිවාර්යෙන්ම ඔයාලට එයාලා කතා කරනවා.

**අලුතින් හිතුවොත්..,**
**කරන්න බැරි**
**දෙයක් නෑ...**



**පත්තර කලාවේ ප්‍රවීණයෙක් විදියට ලියන්න අඳින්න කැමැති අපට මල් මාමා දෙන්න කැමැති මොන වගේ උපදෙසක්ද?**

ඔයාලා කතාවක් ලියනවා නම් ඒ කතාවෙන් පාඨකයාට පණිවිඩයක් දෙන්න ඕනෑ. ඒ වගේම කුතුහලයක් ඇතිවෙන්න ඕනෑ. සැබෑ සිද්ධියක් ලියනවා නම් ගොඩක් හොඳයි . එය සෑ විටම සිදු නොවන අසාමාන්‍යය සිදුවීමක් වෙන්න ඕනෑ. ඔයාලා යූ ටියුබ් බලනවා නම් බලන්න සියස ඇනිමේෂන් කියලා චැනල් එකක් තියෙනවා. එකේ මම ගොඩක් සරලව කියලා දෙනවා කොහොමද අපි නිර්මාණයක් කරන්නේ කියලා.

**මේ දවස්වල මල් මාමා මොකද කරන්නේ?**

මම දැන් විජය පත්තරෙන් විශ්‍රාම ගිහින් ඉන්නේ. ඒත් පත්තරේට "මකාගේ යලක්" චිත්‍ර කතාව තවම ලියනවා. නිර්මාණ වැඩ කිහිපයක්ම කරන ගමන් ඉන්නේ . විවේකී කාලය පොත් පත්තර බලමින් කාලය ගත කරනවා.

කේ. ඒ. වෙනුරි කාව්‍යා
රත්නාවලී බාලිකා විද්‍යාලය
11 ඒ

**පුළා පුතාලා හැමෝටම අඳින්න පුළුවන්**




# අඹ ගසේ පුසුඹ නිසා හැඳුණු අඹේපුස්සට සිරිපතුල අහිමි වුණු හැටි

**කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ කීරවැලි පත්තුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 83 ග්‍රාමසේවා වසමට අයත් අඹේපුස්ස ග්‍රාමය දිගු ඉතිහාසයකට උරුමකම් කියයි. ඈත අතීතයේ මුතුරාජ සඳගල තැන්න ලෙස හැඳින් වූ මෙම ග්‍රාමය අඹේපුස්ස ග්‍රාමය බවට පත් වූ අන්දම ජනප්‍රවාදයේ මෙසේ සඳහන් වෙයි.**



අඹ ගස හමු වූ ස්ථාන ලෙස සැලකෙන වෙල මැද බෝධිය

තොරතුරු
ශ්‍රී සිද්ධ පත්තිනි පුරාණ දේවාලයේ
ප්‍රධාන කපු මහතා පී. කේ. ප්‍රේමදාස

සටහන හා ඡායාරූප
ඩබ්. ඒ. මෙත්මි හංසනී වීරක්කොඩි
8 වසර
කෑ/වර/ ධර්මසිරි සේනානායක ජාතික පාසල

මීට වසර හත් අටසීයකට පෙර මුතුරාජගල තැන්නට පිරිසක් ලිහිණිය කැපීම සඳහා මෙම ග්‍රාමයට පැමිණ තිබේ. ඒ පැමිණි විට වර්තමානයේ නා බෝධිය අම්බලම වශයෙන් තිබෙන ස්ථානය ගන මුකලානයකි. එම ලිහිණිය කැපීමට ආ පිරිසට පුසුඹක් දැනී තිබේ. මේ පුසුඹ ඔස්සේ ගමන් කළ විට ඒ නා බෝධියත් ඒ අසළ කොට අඹ ගසක් තිබී ඇත. ඒ පිරිසට දැනී ඇත්තේ ඒ අඹ ගසේ පුසුඹය. මේ අඹ ගෙඩියේ විශේෂත්වය නිසා එම කොට අඹ ගස තිබූ ස්ථානය පත්තිනි දේවාභරණ වැඩමවා ඇත. එයින් අඹ ගෙඩියේ පුසුඹ ඔස්සේ මෙම ප්‍රදේශයට පැමිණි නිසා අඹ ගෙඩියේ පුසුඹ අඹේපුස්ස බවට පත්ව ඇත.

අද වන විට එම දේවාභරණ අඹේපුස්ස ග්‍රාමයේම වෙනත් පූජනීය ස්ථානයකට වැඩමවා පූජෝපහාර කරනු ලබයි. ශ්‍රී සිද්ධ පත්තිනි දේවාලය ලෙසින් ගම්මුන්ගේ විශ්වාසය හා ගෞරවය දිනූ පූජනීය භූමියක් බවට වසර සිය ගණනාවක සිට පැවත එයි. එපමණක් නොව මේ පුරාණ පත්තිනි දේවාලය හාස්කම් අතින් ඉතාමත් ඉහළ තැනක පවතී.

අපේ අඹේපුස්ස ගම්මානය ඉතා මනස්කාන්ත භූමිභාගයකි. සිංහ සේයාවෙන් නැගී හිඳින මුතුරාජගල සඳගල තැන්න පර්වතය විශ්මිත පින්බිමක් බව දැකිය හැකිය. අප බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කර උතුම් ශ්‍රී පාදස්ථාන පිහිටුවීමට තීරණය කළේ මෙම ගෙල පව්ව මතය. එහෙත් ඒ වන විට මේ ප්‍රදේශයේ නායකත්වය දැරූ වසවත් කුමරු විසින් මෙම පවුව මත සතුන්ගේ අංගොඩක් ගොඩ ගසා තිබී ඇත. ඒ මුතුරාජගල සඳගල තැන්න කඳු මුදුන අංගොඩ නමින් හඳුන්වන්නේ ඒ නිසා බව ජනප්‍රවාදයේ පවතියි. එපමණක් නොව සතුන්ගේ අං ගොඩ ගසා තිබූ නිසා ඒ ලොව්තුරු සිරි පතුල අඹේපුස්ස ග්‍රාමයට අහිමි වූ බව පෙනෙයි. මේ අනුව අඹේපුස්ස ඈත අතීතයේ පටන් ඓතිහාසික වටිනාකමක් ඇති පුරාණ ග්‍රාමයක් බව පැහැදිලිය.



ශ්‍රී සිද්ධ පත්තිනි පුරාණ දේවාලය (රංගුල් ගුහාව)

## සිතුවිලි අලුත් කරන ගී රසවින්දන වැඩසටහනක්



ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ සංස්කෘතික අංශයේ හා ළමා හා කාන්තා ප්‍රවර්ධන නිලධාරී නැන්දලා මාමලාගේ මෙහෙයවීමෙන් පසුගියදා බුරුන්නාව විහාරස්ථානයේදී ගී රස වින්දනාත්මක වැඩසටහනක් පැවැත්විණි. බුරුන්නාව, ඔත්නාපිටිය හා නාපේ යන වසම්වල සහෝදර සහෝදරියන් මෙම වැඩසටහනට සහභාගි වූ අතර අප වැනි පුංචි දරුවන්ගේ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය.

**චතුම් රශ්මිත වික්‍රමතිලක**
**7 වසර**
**කෑ/ගලිගමුව ම.ම.වි.**

## පෙර පාසල් සහෝදර සහෝදරියන්ට නොමිලේ දිවා ආහාරය



ළමා සංවර්ධන අමාත්‍යාංශයේ මුල් ළමා විය සංවර්ධන ජාතික කාර්යාලයේ දායකත්වයෙන් වරකාපොළ කොට්ඨාසයේ අඩු බර සහෝදර සහෝදරියන් සහිත පෙර පාසල් 15කට දිවා ආහාරය නොමිලේ ලබා දෙයි.
මේ සඳහා ගමේ එළවළු සහ පළතුරු ලබා දීමට මවුපියෝ ඉදිරිපත්ව සිටිති. ඒ සහෝදර සහෝදරියන්ට හොඳ පෝෂණයක් මෙන්ම පෙර පාසල් කාලය තුළ ඒ අය ක්‍රියාකාරී හා උද්යෝගිමත් ලෙස හැසිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මෙය ඉතා සාර්ථක හා දීර්ඝකාලීන ප්‍රතිලාභ සහිත වැඩසටහනකි.

**සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක**
**9 වසර**
**කෑ/ගලිගමුව ම.ම.වි.**



## අඹේපුස්සේ සෑම නිවෙසකටම සරුසාර ගෙවත්තක් හඳුන්වා දෙයි

වරකාපොල කොට්ඨාසයේ අඹේපුස්ස වසමේ ගෙවතු වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගිය 8 වැනිදා ප්‍රාදේශීය ලේකම්වරයාගේ උපදේශකත්වයෙන් පෝෂිතාරාම විහාරස්ථානයේදී පැවැත්විණි.
ඉතාමත් හරවත් දේශනවලින් සමන්විත වූ මෙම වැඩසටහනට අපේ ගමේ නැන්දලා මාමාලා විශාල පිරිසක් එක්ව සිටියහ. වසමේ කෘෂි කමිටුව විසින් මෙහෙය වූ මෙහි මූලික අරමුණ වූයේ අඹේපුස්ස වසමේ සෑම නිවෙසකම සරුසාර ඵලදායී ගෙවත්තක් නිර්මාණය කිරීමයි.

**සංජන කාවින්ද්‍ය වික්‍රමතිලක**
**9 වසර**
**කෑ/ගලිගමුව ම.ම.වි.**



## වරකාපොල කලාපයේ නව සංවර්ධන නැන්දලා මාමාලාගේ අලුත් වැඩක්

වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මුලිකත්වයෙන් මානව සම්පත් සංවර්ධන වැඩසටහනක් පසුගිය 16 වැනිදා තෝලංගමුව රජමහා විහාරස්ථානයේදී පැවැත්විණි. එහිදී අත්දැකීම් බහුල විවිධ ක්ෂේත්‍රවල නිළධාරී නැන්දලා මාමලා විසින් විදේශ රැකියා ,කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්වය, අපනයන සංවර්ධනය , මානව සම්පත් සංවර්ධනය හා උපදේශනය පිළිබඳ පැමිණි සිටි අයව දැනුවත් කිරීමක් කළහ. මෙය සංවිධානය කරනු ලැබුවේ වරකාපොල කලාපය නියෝජනය කරන නව සංවර්ධන නිළධාරී නැන්දලා මාමාලා විසිනි.

එම්.ආර්.දුලාංජලී සෞභාග්‍යා මහගම
8 වසර
කෑ/වර/ ධර්මසිරි සේනානායක ජාතික පාසල




# කවි තරු

**මගේ රට**

උණුසුම සිසිල සොමි ගුණ පිරි පින්බිමකි
දාගැබ් මහා වැව් තැනවුණු ජයබිමකි
අනුබුදු මිහිඳු හිමි වැඩ දම් දෙසූ බිමකි
මේ පෙරදිග ධාන්‍යාගාරය වූ බිමකි

ඩබ්.ඒ.මෙත්මි හංසනී වීරක්කොඩි
8 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල

**රෑ අහස**

බැබළෙන සඳ රෑ අහසේ
දිදුළන තරු මල් වාගේ
අපූරු සිතුවමක් වාගේ
මට නම් හරි පුදුමයිනේ

සඳ වට කර තරු හිනැහෙයි
වට කුරු පුන් සඳ බැබළෙයි
ගත සිත මගේ පුබුදු කරයි
රෑ අහසක සිරිය පෙනෙයි

ඒ.පී. සනුලි ලිසාරා වික්‍රමතිලක
5 වසර
කෑ/ඩඩ්ලි සේනානායක ජාතික පාසල

**පළමු ගුරුතුමිය**

පැතුම් පොදි බැඳ දෙනෙත් අභියස මතකයි එදා හමුවුණා
නුඹේ මුවගෙහි සිනා කැන් දක අපේ සිත් පොඩි ළං වුණා
ගුරු මෑණියනි නුඹ හිමි හිමින් අප වෙතම ළං වුණා
මවක් සේ සෙනෙහස දෙමින් නුඹ අප මහමගට යොමු කළා


හදක කඳුලැල් පිසදමා සැකසුවේ නුඹ සිය දහස් දරුකැළ
ලෝකයට පියමනින සිසුකැළ ජය මගේ කෙළවරට ගෙන යන
තුඩින් තුඩ ගුරු පෙමින් රස කර සිප් කිරෙන් අප පෝෂණය කර
නුඹයි අපගේ දෙවැනි මවු කිසිදාක කිසිවිටෙක අමතක නොවන

එල්.ඒ. සඳුනි උමංෂා රුවන්සිරි
11 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල



තිළිණ මෝටර්ස්
ජයග්‍රාහී ගමනක් සඳහා...
BIKE සක්වල
ඔබගේ සිහිනය ලියාපදිංචි කරන ලද ත්‍රීරෝද රථයක් හෝ මොටර් සයිකලයක් නම්
එන්න
අප වෙතට


• තත්ව පරීක්ෂාවට ලක් කරන ලද ඉහළම තත්වයේ යතුරු පැදි හා ත්‍රීරෝද රථ
• තිළිණ මෝටර්ස් වෙතින් අසමසම විශ්වාසය
තිළිණ මෝටර්ස්
0718 49 49 49
අංක 344, කොළඹ පාර, අඹේපුස්ස, වරකාපොල.


# තෑගි දිනූ තරු මිතු



- තිත්තිර ජාතකය -
කේ. කේ. අම්ෂ මිලාන් තරිවිලකන්ද
9 වසර
කෑ/වර/අබේපුස්ස මහා විද්‍යාලය



- හැමදාම දන්සලක් -
කේ. කේ. අම්ෂ මිලාන් තරිවිලකන්ද
9 වසර
කෑ/වර/අබේපුස්ස මහා විද්‍යාලය




ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ගෙන දෙවන පෑතිස් රජු ජම්බුකෝළපට්ටනයට පැමිණීම
එල්. එම්. පසන්ජිත්
10 වසර
අනුරධම්ම දහම් පාසල



- සාලිකේදාර ජාතකය -
කේ. කේ. පසිඳි පබසරා
3 වසර
කෑ/වර/අබේපුස්ස මහා විද්‍යාලය



එම්. ඒ. රවිෂ් ධීවාන් සුලක්ෂණ
පුංචි කැකුළු පෙර පාසල
මාහේන




එම්. ඒ. පවන් සුලක්ෂණ
6 වසර
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල



ඩී. ජී. තිනුර නිම්සර දසනායක
9 වසර

## ප්‍රහේලිකා අංක 01



කේ. ඒ. වෙනුරි කාව්‍යා
11 - A
රතනාවලී බාලිකා විද්‍යාලය

**හරහට**

1. ප්‍රසිද්ධ පූජා භූමියකි.
3. යමකට සිදුවන අලාභය වෙනුවෙන් ගෙවයි.
6. අවුරුදු කාලයට වාදනය කරයි.
7. දේවානම්පියතිස්ස රජුගේ අක්වර්ථ නාමයකි.
10. මුස්ලිම්
12. යමක් කැපීමට උපකාරී වේ.
13. යමක් ආවරණය කිරීමට දමන රෙදිකඩ.
14. කර මතින් ගෙනයන බර.
15. ශරීරය
16. සමහර සිව්පාවුන්ට පිහිටා ඇත.
17. ප්‍රසිද්ධ දුම්රිය පොළකි.
19. පුරාණයේ දඬුවම් දීමට යොදා ගත්තකි.
21. නුවණට අධිපති.
22. ජීවයේ පැවැත්මට උපකාරී වේ.

**පහළට**

1. ඡන්දයේ දී භාවිතා වේ.
2. මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
4. මව
5. ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදු වූ ස්ථානය.
8. පිටුපස දොර
9. යමක බර
10. ඓතිහාසික චෛත්‍යයකි.
11. බලවත් අපහසුතාව
13. තනි ගොනෙකු බැඳි කරත්ත
15. රත්තරං
18. විනාශකාරී උපකරණ
20. ශරීරයේ පිටතින්ම ඇත.

- ප්‍රහේලිකාව පුරවා එහි ඡායාරූපයක් 076 344 94 04 දුරකථන අංකයට වට්ස්ඇප් කර තෑගි දිනා ගන්න.
- නිවැරදිව පුරවා එවන පළමු දස දෙනාට තරු පලස ළමා සමාජයෙන් වටිනා පොත් කට්ටලයක්.
- ඉක්මණින් ප්‍රහේලිකාව පුරවා අපට එවා ඔබත් ජයග්‍රාහකයින් අතරට එක්වන්න...





# ජනප්‍රිය රංගන ශිල්පී

# කෝකිල පවන් ජයසූරිය

## මම හරිම කැමතියි මට අත්පුඩි ගහනවට

## ගෙදර හිටියොත් රසට උයනවා

**එදා 2010 වසරේ චීනයේ පැවැති දසවැනි අන්තර්ජාතික චිත්‍රපට උළෙලේ රටවල් 250 ක් අතරින් හොඳම ළමා නළුවාට හිමි සම්මානය දිනාගැනීමට ඔහුට හැකි විය. ඒ සිරි රජසිරි චිත්‍රපටයේ කිරිඉබ්බන්දෙනියේ සිරිමල්ගේ චරිතය වෙනුවෙනි. අද වන විට සරසවි සම්මාන, සිග්නීස් සම්මාන හා රයිගම් සම්මාන රැසකට හිමිකම් කියන ඔහු අද කා අතරත් ජනප්‍රිය නාඩගම් කාරයෝහි මනමාලන්ගේ චරිතයෙනි. ඔහු ජනප්‍රිය රංගන ශිල්පී කෝකිල පවන් ජයසූරිය යි. මේ ඔහු සමග කළ කෙටි කතාබහකි.**

❖ මේ දවස්වල මොකද කරන්නේ ?

රූගත කිරීම්වලට සහභාගි වෙන එක තමයි මේ දවස්වල කරන්නේ.

❖ පවුලේ විස්තර ටිකක් කියමු ?

මගේ පවුලේ ඉන්නේ ආච්චියි,සීයයි, මල්ලියි, මගේ බිරිඳයි.

❖ ඉගෙන ගත්තේ මොන පාසලේද ?

පිළියන්දල මධ්‍යම මහ විද්‍යාලයෙන්.

❖ රංගනයට එකතු වුණේ කොහොමද ?

රංගනයට අඩිතාලම වැටුණේ පාසල් වේදිකාවෙන් හා දහම් පාසල් වේදිකාවෙන්.

❖ ඊට පස්සේ ඔබේ ගමන් මග කිව්වොත් ?

මුලින්ම මගේ නාට්‍ය ගුරුතුමිය වූ කෝකිලානී ගුරුතුමිය මගේ ගායන හැකියාව දැකලා මාව ස්වර්ණවාහිනියේ හපන් පැදුරට සම්බන්ධ කළා. ඊට පස්සේ බන්දුල කුරුවිටආරච්චි මහතා අධ්‍යක්ෂණය කළ ළමා වේදිකා නාට්‍යයක මී මැස්සෙකුගේ චරිතයක් නිරූපණය කරන්න අවස්ථාව ලැබුණා. ඒ නාට්‍යයට රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ විවෘත අංශයේ සම්මාන 9 ක් සමග පළමු ස්ථානය දිනා ගැනීමට හැකි වුණා. තව 2008 දී මැජික් බන්ටි වේදිකා නාට්‍යයේ රඟපෑම වෙනුවෙන් හොඳම නළුවා සම්මානය ලැබුණා. ඊට පස්සේ කෝකිලානි ගුරුතුමිය මාව ජයලත් මනෝරත්නයන්ගේ තල මල පිපිලා වේදිකා නාට්‍යයට සම්බන්ධ කළා. කෝකිල පවන් කියන රංගන ශිල්පියා නිර්මාණය කළ ප්‍රධාන පුද්ගලයා ජයලත් මනෝරත්න මහතා.

**ජීවිතේ හදාගත්තේ පාසලෙන් සහ දහම් පාසලෙන්**

❖ කිරිඉබ්බන්දෙනියේ සිරිමල් වුණේ කොහොමද ?

පුවත්පත් දැන්වීමක් දැකලා ආච්චි අයදුම්පතක් දැම්මා. මට අද වගේ මතකයි ආච්චිත් එක්ක ඒ සම්මුඛ පරීක්ෂණයට ගිය හැටි. ළමයි දහස් ගණනක් අතරින් සෝමරත්න දිසානායක මාමා මාව සිරිමල්ගේ චරිතයට තෝරා ගත්තා. මගේ ජීවිතේ සංධිස්ථානයක් තමයි ඒ.

❖ ඒ චරිතය ඔබට අභියෝගයක් වුණාද ?

මට හැම චරිතයක්ම අභියෝගයක්. මොකද හැම චරිතයක්ම මම නොවන චරිතයක්. මම කෝකිල. මම රඟපාන්නේ සිරිමල්, මනමාලන් හෝ ශක්ති වගේ චරිතයක්. මම ඒ චරිතයට සම වැදිලා ඒ චරිතයේ දෙබස් කියවලා ඒ චරිතයේ ජීවත් වෙන්න ඕනෑ. සිරිමල් කියන්නේ ගමේ ජීවත්වෙන, පීනන්න පුළුවන්, මී හරකුන්ගේ පිටේ යන්න පුළුවන් දක්ෂ චරිතයක්. ඉතිං මට ඒ චරිතය අභියෝගයක් වුණා.



❖ අන්තර්ජාතික ළමා චිත්‍රපට උළෙලේ හොඳම ළමා නළුවාට හිමි සම්මානය ලබා ගනිද්දී මොකද හිතුණේ ?

ලොකු සතුටක්. මොකද මම හරි කැමතියි මට අත්පුඩි ගහනවට. මම සම්මානය ලබා ගනිද්දී හයියෙන් අත්පොලසන් හඬක් ඇසුණා. ඒ සම්මාන උළෙලට යන්න ලැබීමත් ඒ සම්මානය මගේ අතින්ම ගන්න ලැබීමත් මගේ භාග්‍යයක් කියලා හිතන්නේ.

ඔබට සෝමරත්න දිසානායක, රේණුකා බාලසූරිය, ජැක්සන් ඇන්තනී, ජයලත් මනෝරත්න වැනි ප්‍රවීණයන්ගේ ඇසුර කුඩා කාලයේ සිටම ලැබිලා තියෙනවා. ඒ අයගේ ආභාෂය ඔබ කොහොමද අවස්ථාවක් කරගත්තේ?

අපි හැමෝගෙම ජීවිතවල දුර්වලතා තියෙනවා. ඒ දුර්වලතා මග හැරගෙන කොන්ද කෙළින් තියාගෙන නැගිටින්න පුළුවන් ශක්තියක් කලාවේදි විතරක් නෙවෙයි ජීවිතේදිත් මම ඒ අයගෙන් ලබා ගත්තා.

❖ පාසලෙන් ලැබුණේ මොනවගේ ප්‍රතිචාරයක්ද ?

හොද ප්‍රතිචාරයක් ලැබුණා. ඒ වගේම අධයාපන කටයුතු හා රංගන කටයුතු සමබර කරගෙන යන්න ලොකු සහයෝගයක් පාසලෙන් වගේම දහම් පාසලෙන් ලැබුණා.

මම මොනවටද දක්ෂ මාව ඒ අංශවලට ගුරුවරු යොමු නොකරන්න කෝකිල පවන් කියන රංගන ශිල්පියෙක් අද මෙතන නැහැ.

❖ විවේක වෙලාවට මොකද කරන්නේ ?

රංගනයේ මගේ මූලික අධ්‍යාපනය තමයි චිත්‍රපට. මට විවේකයක් ලැබුණු වෙලාවට චිත්‍රපට බලනවා. ඒ වගේම මට රසට උයන්න පුළුවන්. නිවාඩු දවසට ගෙදර අයට රසට කෑම හදලා දෙනවා.

**ඊළඟ ඉලක්කය අධ්‍යක්ෂවරයෙක්වීම**

❖ රංගනයෙන් ඉදිරියට එන්න කැමති දරුවෙකුට ඔබ මොනවද කියන්නේ ?

එක් එක් චරිතවලට සම වැදිලා ඇක්ෂන් කට් කියන අන්ත දෙක තුළ මනසේ හෝ ශරීරයේ මොන තරම් බාධක තිබුණත් ඒ චරිතයට අවංක වෙලා කැපවීමෙන් සාධාරණයක් කරන චරිතයක් තමයි නළුවෙක් කියන්නේ. අපි මොන දේ කළත් අවංකව කැපවීමෙන් කරනවා නම් ඕනෑ දෙයක් සාර්ථක කරගන්න පුළුවන් කියලා තමයි මම කියන්නේ.

❖ ඊළගට ළඟා කරගන්න කැමති ඉලක්කය මොකක්ද ?

සංගීතය පැත්තෙන් ඉදිරියට යන්න ඕනෑ. අධ්‍යක්ෂකවරයකුවීම තමයි මගේ හීනය. ඒ හීනවලට යන්න බලාපොරොත්තු වෙනවා.


සටහන - එල්. ඒ. සඳුනි උමංෂා රුවන්සිරි
11 ශ්‍රේණිය
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල


**අවංකව කැපවීමෙන් වැඩ කළොත් දිනන්න බැරි අභියෝග නෑ**

# පුංචි අපිට ගෙවත්තක්

අපේ තරු පලස ළමා සමාජය විසින් මාස කිහිපයකට පෙර සාමාජිකයින් හට ළමා ගෙවතු වගා සඳහා එළවළු බීජ බෙදා දුනි ඒවායින් තෝරාගත් සාර්ථක ගෙවතු වගා කිහිපයකි මේ

සංජන (සභාපති)



එම්. ආර්. අංජලී ඉමේෂා
11 ශ්‍රේණිය
කෑ/වර/අඹේපුස්ස ම. වි.



ඒ. නවීන් දෙනුවර රත්නායක
3 ශ්‍රේණිය "අරලිය"
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය

## අපි එළවළු පාත්තියක් හදමු

උපදෙස්
අඹේපුස්ස කෘෂි නිලධාරී
සෙනරත් වීරසිංහ

අපේ රට අද දැඩි ආර්ථික අර්බුදයක තිබෙන බව අපි දනිමු. අපේ මවුපියන් අපව පෝෂණය කිරීමට අද වැනි කාලයක ගන්නේ දැඩි වෙහෙසකි. පුංචි අපටත් ඔවුන්ට පොඩි සහයෝගයක් දෙන්න පුළුවන් නම් කොයිතරම් අගනේද? ඉතිං පුංචි අපට නිවසේ සිටම අපේ මවුපියන්ගේ ආර්ථිකයට සහයෝගය දිය හැකියි. ඒ අපේ ගෙවත්තේ ඉඩ ඇති සෑම තැනකම වගා කිරීමෙනි. අපි පුංචි එළවළු පාත්තියක් සකස් කර ගන්නේ කෙසේද යන්න අපේ ගමේ කෘෂි නිලධාරී සෙනරත් වීරසිංහ මාමා අපට පැහැදිලි කළේ මෙලෙසිනි.

1. හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක් තෝරාගන්න.
2. දිග කැමති ප්‍රමාණයක් ගෙන පළල අඩි 4 ක් පමණ වන සේ කොටුවක් හෝ රවුමක් වෙන් කරගන්න.
3. වෙන් කරගත් කොටසේ හොඳින් පස් බුරුල් කරගන්න.
4. ඉන්පසු පාත්තිය තුළ අඩියක් පමණ උසට මුදුන් කරගන්න.
5. කුකුළු සහ එළු මළපහ මෙන්ම වැටමාර අතු ද ඒ පස් සමග මිශ්‍ර කරගන්න.
6. පාත්තියේ පස් හොඳින් තද කර දිනකට වරක් ජලය දමන්න.
7. ඉන්පසු විනිවිද පෙනෙන ඉටි කොළයකින් දින 14 ක් වසා ජීවානුහරණය කරන්න.
8. දින 14 කට පසු ඔබ කැමති එළවළුවක බීජ 3 ක් හෝ 4 ක් අඟලක පමණ වළක් තුළ පැළ කරන්න.
9. දිනකට දෙවරක් වතුර දමන්න. දින කිහිපයකට පසු පැළ මතු වේ.
10. සුදුසු කාලයේදී පැළවලට ආධාරක යොදන්න.

ඔබට ස්වාභාවික කෘමිනාශක ලෙස ලිපේ අළු, දුන් කොළ පෙඟවූ වතුර, කොහොඹ ඇට තළා ජලය සමග, කොහොඹ තෙල් ජලය සමග සහ සුදුලූණු තලා ජලය සමග භාවිතා කළ හැකියි.







සටහන සහ ඡායාරූප
කේ. කේ.අමීෂ මිලාන් කරිවිලකන්ද - 9 වසර
කේ. කේ. පසිඳු පබසරා - 3 වසර
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය



එල්. ඒ. සඳුනි උමංෂා
11 ශ්‍රේණිය
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල



පී. සඳුන් චමෝද්‍ය ප්‍රේමරත්න
11 ශ්‍රේණිය
කෑ/වර/විද්‍යාප්‍රකාශන විද්‍යායතනය



ඩබ්. ඒ. විමුද් ගිම්සර පෙරේරා
9 ශ්‍රේණිය
කෑ/වර/ධර්මසිරි සේනානායක ජාතික පාසල











# අපි තරු පලස ළමා සමාජයයි...





නිමක් නැති ඉමක් නැති අහසේ බබළන තරුවලට බුමුතුරුණු සකසන අපේ තරු පලස ළමා සමාජය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැන්දලා මාමාලා එක්ව 2022 වසරේ මාර්තු 15 වැනිදා සවස 3 ට අඹේපුස්ස වෙලමැද බෝධිය අසළදී පිහිට වූයේය. අපේ ගමේ සහෝදර සහෝදරියන් හැටපස් දෙනකු පමණ සාමාජිකත්වය දරන තරු පලස ළමා සමාජය අප්‍රේල් 11 වැනි දින පෝෂිතාරාම විද්‍යාල ක්‍රීඩාංගනයේ දී බක් මහ උළෙලක් ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය. ඉන් අනතුරුව බුදුරදුන්ගේ අසිරිමත් බුදු තෙමඟුල සිහිපත් කරමින් වෙසක් පෝය දින සිසිල් පැන් බීම දන්සලක් අපේ ගමේ නැන්දලා මාමාලාගේ සහයෝගයෙන් පැවැත්විය. පොසොන් පොහොය දින නිමිති කරගනිමින් අපේ ළමා සමාජය විසින් පොසොන් කූඩු තරගයක් පෝෂිතාරාම විහාරස්ථානය ආලෝකමත් කරමින් පැවැත්විය. එදිනම විශේෂ බෝධි පූජා වැඩසටහනක් ද කොත්තමල්ලි දන්සලක් හා භක්ති ගීත වැඩසටහනක් පැවැත්වීම විශේෂත්වයකි. ඉන්පසු පසුගිය 5 වැනිදා වෙලමැද බෝධිය අසළ වෙල්යායේදී අපේ සහෝදර සහෝදරියන් එක්ව සරුංගල් තරගයක් පැවැත්විය . මේ ආකාරයෙන් ඉතාමත් කෙටි කාලයකින් ගත් සියලු උත්සහායන් සාර්ථකව නිමා කරගැනීමට අපේ ළමා සමාජයට හැකි විය. ළමා සමාජය මඟින් ප්‍රථම වරට එළි දක්වන "ඊ තරු " අන්තර්ජාල සඟරාවද එවැනි සාර්ථක උත්සාහයන්ගෙන් එකකි.







එම්. ආර්. ඉමේෂා අංජලී
11 එම්
කෑ/වර/අඹේපුස්ස මහා විද්‍යාලය





